**CATHOLIC BISHOPS' CONFERENCE IN SRI LANKA**

Lankarama, 19, Balcombe Place, Colombo - 08, Sri Lanka.

Tel. No : 0094-11- 2697062 / 2697110
Fax.No : 0094-11- 2699619
E-mail : EpiscopalSL@gmail.com


## ශ්‍රී ලංකා කතෝලික රදගුරු සම්මේලනයේ පාස්කු පණිවුඩය 2026

# අපට සොහොන් ගෙයි දොරකඩින් ගල ඉවතට පෙරළා දෙන්නේ කවරෙක් ද?

මේ වසරේ පාස්කු පණිවුඩය ඔබ වෙත පැමිණෙන්නේ ලෝකයේ ප්‍රබලතම ලෝක බලවතුන් විසින්, ඇතැම් විට තම පෞද්ගලික අවශ්‍යතා සාක්ෂාත් කර ගැනීම සඳහා, මෙහෙයවමින් තිබෙන කුරිරු යුද්ධය හේතුකොට ගෙන සමස්ත ලෝකයම භීතියෙන් වෙළී සිටින අවස්ථාවක ය. අහිමි වූවන් වෙනුවෙන් ශෝක වන සහ තුවාල ලැබූවන්ට සත්කාර කිරීමට උත්සාහ දරන පවුල් බොහෝමයකගේ සෝෂාකාරී හඬා වැළපීම්වල දෝංකාරය නිසා දූවෙන වේදනාවෙන් අපගේ හදවත් බර වී ඇත.

මෙම අහිංසක වින්දිතයින් සමග අපි යාච්ඤායෝගී සහයෝගිතාවයෙන් සිටින්නෙමු. උත්සන්න වෙමින් පවතින මෙම තත්ත්වයේ ප්‍රතිඵලයක් ලෙස, සාමය වඩ වඩාත් දුර්වල වී ඇති අතර එය දුරස්ථ බලාපොරොත්තුවක් බවට පත්ව තිබේ. එහෙත් පාස්කු පණිවුඩය අපට මතක් කර දෙන්නේ අන්ධකාරය කිසිවිටෙක අවසන් විසඳුම නොවන බවයි. යුද හඬ මැද වුව හිස් සොහොන් ගෙය, නිහඬ නමුත් බලවත් සත්‍යයක් ප්‍රකාශ කරයි.

සොහොන් ගෙයින් නව ජීවයක් පැමිණියේ ය. ජේසුන් වහන්සේව ආලේප කරනු පිණිස උන්වහන්සේගේ සොහොන් ගෙය අසළට පැමිණි කාන්තාවන් විසින් අසන ලද ප්‍රශ්නය වූයේ 'අපට සොහොන් ගෙයි දෙරකඩින් ගල ඉවතට පෙරළා දෙන්නේ කවරෙක් ද?' (මාක් 16:3) යන්නයි. නමුත් ඔවුන් එහි පැමිණි විට, එම විශාල ගල ඒ වනවිටත් සොහොන් ගෙයින් ඉවතට පෙරළා තිබෙනු දුටු ඔවුහු විශ්මයට පත්වූහ. (ලූක් 24:2). ගල ඉවතට පෙරළා තිබූයේ සමිඳාණන් වහන්සේ ය. අද අපට බලාපොරොත්තුවේ පණිවුඩය ලබා දෙන්නේ මෙම සත්‍යතාවයයි.

බොහෝ කැපකිරීම් සහ පරිත්‍යාගයන් සිදුකරන චතාරික සමයෙන් පසුව, නව ගින්න දල්වීම, පාස්කු ප්‍රකාශනය සහ නව කතෝලිකයින් ඇදහිල්ල වෙත බාර ගැනීම ඇතුළත් ආලේලූයියා සෙනසුරාද දේව වන්දනාවෙන් කූඨප්‍රාප්තියට පැමිණෙන ශුද්ධවූ සතියේ දේව වන්දනා පිළිවෙත්වලින් අපි අනුප්‍රාණය ලබමු. මේ සියලු දේව වන්දනා සැමරුම්, ඇදහිලිවන්තයින්ට ප්‍රීතියේ සහ අපේක්ෂාවේ මූලාශ්‍රයක් බවට පත් වන්නේ, උත්ථාන වූ ස්වාමින් වහන්සේ සමග පෞද්ගලික මුණගැසීමෙන් පසුව ''උන්වහන්සේ අප හා සමග කථා කරද්දීත්, ශුද්ධ ලියවිල්ල පහද දෙද්දීත්, අපේ හදවත දූවී ඇවිලී ගියා නොවේද''යි (ලූක් 24:32) පැවසීමට අපට හැකිවූවොත් පමණකි.

## CATHOLIC BISHOPS' CONFERENCE IN SRI LANKA

Lankarama, 19, Balcombe Place, Colombo - 08, Sri Lanka.

Tel. No : 0094-11- 2697062 / 2697110
Fax.No : 0094-11- 2699619
E-mail : EpiscopalSL@gmail.com


අසංඛ්‍යාත අහිංසක ජීවිත බිලිගන්නා සහ තවත් මිනිසුන් පිරිසක්, වෙනස්කමේ තුවාල, ආබාධිත සහ සුව කළ නොහැකි රෝගයන්ට ගොදුරු කරන භීෂණයේ සහ ප්‍රචණ්ඩත්වයේ පර්වතය, ක්‍රමානුකූලව සිදුවන අසමානතාවයන්, බල අවභාවිතය හෝ අසාධාරණ ක්‍රියාවන් මගින් ඇති කරනු ලබන අසාධාරණයේ පර්වතය, ඇතැම් රාජ්‍යයන් විසින් ප්‍රවර්ධනය කරනු ලබන සහ නැගී එන අනාගත පරම්පරාව විසින් ඇලී සිටින ඇබ්බැහිවීම් සහ දුරාචාරයන් විසින් ප්‍රවර්ධනය කරනු ලබන අයුක්තියේ පර්වතය, පෙරළා දමන්නේ කවරෙක් ද යන ගැටළුව සමග ගමන් කරමින් සිටින ලොව පුරා වෙසෙන තරුණ සහ මහළු, අහිංසක හා සාධාරණ, දුප්පත් සහ පොහොසත් මිනිසුන් හට ලබා දිය හැකි එකම පිළිතුර වන්නේ, මෙම පර්වත ඉවතට පෙරළා දැමීමට හැකියාව ඇත්තේ සමිඳාණන් වහන්සේට පමණක් ය යන්නයි.

මහ සිකුරාද, ලෝකය, දුක් වේදනා, අයුක්තිය සහ මරණය දුටු නමුත්, පාස්කු ඉරුදින අළුයම ජීවිතය මරණයට වඩා ශක්තිමත් බවත්, ප්‍රේමය වෛරයට වඩා ශක්තිමත් බවත්, බලාපොරොත්තුව අපේක්ෂා භංගත්වයට වඩා ශක්තිමත් බවත් දෙවියන් වහන්සේ හෙළිදරව් කර වදාළ සේක.

මෙම අඳුරු කාල පරිච්ඡේදයේ දී වුව සමිඳාණන් වහන්සේ, විශ්වාස කළ නොහැකි, සිතා ගත නොහැකි සහ සෙලවිය නොහැකි බාධක නමැති පර්වතය පෙරළා දමන බවට වන සහතිකය සමග ඔවුන් වහන්සේගේ උත්ථානය මෙම අඳුරු කාල පරිච්ඡේදයේ දී වුව අපගේ ඇදහිල්ල අලුත් කර අපගේ බලාපොරොත්තුව ශක්තිමත් කරත්වා! බලයේ සිටින්නන්ගේ 'අවංක සිත් හැරීම' මගින් 'කායින්ගේ හස්තයේ' පාලනය ජය ගනිත්වා! යි අපි මේ පාස්කු සමයේ දී නොකඩවා යාච්ඤා කරමු.

සියලු සැදැහැවතුනට ප්‍රීතිමත් පාස්කු මංගල්‍යයක් වේවා! යි කතෝලික රදගුරු මණ්ඩලය ප්‍රාර්ථනා කරයි.

✠ අති උතුම් හැරල්ඩ් ඇන්තනි පෙරේරා
කුරුණෑගල රදගුරු හිමිපාණෝ
සභාපති
ශ්‍රී ලංකා කතෝලික රදගුරු සම්මේලනය

CATHOLIC BISHOPS' CONFERENCE
SRI LANKA

✠ අති උතුම් ඇන්ටන් රංජිත්
කොළඹ සහයක රදගුරු හිමිපාණෝ
අපෝස්තලික පරිපාලක, මඩකලපුව පදවිය
මහා ලේකම්
ශ්‍රී ලංකා කතෝලික රදගුරු සම්මේලනය

2026 මාර්තු 25 දින දී ය.

CamScanner